# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/59 - 2022 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා - 2022.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1) ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් පත් කරන ලද රාජ්‍ය අමාත්‍යවරුන් වෙත විෂයයන් සහ කාර්යයන් පැවරීම වහාම ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය,
බත්තරමුල්ල.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

**ගරු අ. අලගියවන්න ලසන්ත, ප්‍රවාහන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණපනත්* |
|---|---|---|
| කාර්යක්ෂම හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා ප්‍රවාහන ජාලය සංවර්ධනය කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශයට ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ප්‍රවාහන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහි II වැනි තීරුවේ දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව<br>2. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව<br>3. සීමාසහිත ලක්දිව ඉංජිනේරු (පෞද්) සමාගම<br>4. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | මෝටර් රථ ප්‍රවාහන පනත (1951 අංක 14)<br>ජාතික ප්‍රවාහන ආයතන පනත (1997 අංක 25) |

## උපලේඛනය II

**ගරු ගමලත් සිරිපාල, මහාමාර්ග රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණපනත්* |
|---|---|---|
| සහසම්බන්ධිත නවීන මාර්ග පද්ධතියක් ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශයට ප්‍රතිපත්තිමය මගපෙන්වීමක් සිදු කිරීම හා නියමිත නීති හා අණපනත්වලට අනුකූලව මහාමාර්ග විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහි II වැනි තීරුවෙහි දක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම | 1. මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඇති පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්<br>2. සහස්‍යා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | |

## උපලේඛනය III

**ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්, ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති හා අණපනත්* |
|---|---|---|
| සහසම්බන්ධිත නවීන මාර්ග පද්ධතියක් ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශයට ප්‍රතිපත්තිමය මඟපෙන්වීමක් සිදු කිරීම හා නියමිත නීති හා අණපනත්වලට අනුකූලව මහාමාර්ග විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහි II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම | 1. මගනැගුම අංශය<br>2. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත |

EOG 10 - 0131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.